www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: දෙමල වැසියන් සිය ගනනක් කොලඹින් බලාත්කාරයෙන් පලවා හැරෙයි

## Sri Lanka: Hundreds of Tamils forcibly expelled from Colombo

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**
**2007 ජුනි 12**

කොලඹ පිහිටි ලාභ ලැගුම් හල්වලට (ලොජ්) කඩා පැන ඒවායේ රැඳී සිටින දෙමල නේවාසිකයන් අගනුවරින් බලාත්කාරයෙන් ඉවත් කරන ලෙස ජූනි 7 දා ශ්‍රී ලංකා ආන්ඩුව පොලීසියට අන කලේ ය. මෙය වනාහි විවෘතව ම නීති විරෝධී ක්‍රියාවකි. පොලීසිය තුවක්කු තුඩින් සාමාන්‍ය දෙමල ජනයා සිය ගනනක් කොටු කර, ඔවුන් බස් රථවලට පටවා, උතුරේ වවුනියාව හා නැගෙනහිර ත්‍රිකුනාමලය යන ඈත නගරවලට ගෙන ගොස් අතහැර දැමී ය.

කොලඹ නගරයේ පිටකොටුව, මරදාන, කොටහේන හා වැල්ලවත්ත ප්‍රදේශවල මෙම පූර්ව-අලුයම් කඩා පැනීම සිදු කෙරුනේ කිසිදු අනතුරු ඇඟවීමකින් තොරව ය. පොලීසියට අනුව, 376 දෙනෙක් -- පිරිමි 291 හා කාන්තාවන් 85 -- රඳවා ගෙන බස් රථ අටකින් උතුරට හා නැගෙනහිරට ගෙන යන ලදි. කිසිවකුට කිසිදු අපරාධයක් සම්බන්ධයෙන් චෝදනා එල්ල කෙරුනේ නැත.

පොලිස්පති වික්ටර් පෙරේරා මෙම මෙහෙයුමේ වර්ගෝත්තමවාදී පදනම එලිදරව් කරමින් ප්‍රකාශ කලේ, "කොලඹ හා අවට උප-නගර ප්‍රදේශවල ජීවත් වන අහිංසක ජනයාගේ ආරක්ෂාව" සහතික කර ගනු වස් එය අවශ්‍යව ඇති බව යි. වෙනත් වචනවලින් කිය තොත්, කොලඹ ආන්ඩුව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි සිය යුද්ධය තීව්‍ර කරමින් සිටින තතු යටතේ. සියලු දෙමල ජනයා සැලකෙන්නේ සතුරන් ලෙස ය. කොලඹ පිටකොටුවේ හා රත්මලානේ මෑත දී සිදු වූ බෝම්බ පිපිරීම් දෙකක් සම්බන්ධයෙන් එල්ටීටීඊයට චෝදනා එල්ල කෙරී ඇත.

ජූනි 7 මෙහෙයුමට පාත්‍ර වූ දෙමල ජනයාට කොලඹ රැඳී සිටීමට "වලංගු හේතුවක් නො තිබූ" බව පවසමින් කොලඹ ප්‍රදේශයේ නියෝජ්‍ය පොලිස්පති රොහාන් අබේවර්ධන ඔවුන් පලවා හැරීම යුක්තියුක්ත කිරීමට යත්න දැරී ය. අගනුවර තාවකාලික නේවාසිකයන්ව සිටින තවත් දස දහස් ගනන් දෙමල ජනයා ද පලවා හැරෙනු ඇත යන අපේක්ෂාව අබේවර්ධනගේ ප්‍රකාශ මගින් මතු කෙරෙයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට සිය පදිංචි ස්ථානය වෙනස් කිරීමට නිල අනුමැතියක් අවශ්‍ය ය යන්නට කිසිදු නීතිමය පදනමක් නැත.

මෙමෙහෙයුමෙන් යන්තම් පැය ගනනකට පසුව කතා කල ආන්ඩුවේ ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල විවේචන ගැන කිසිදු තැකීමක් නොකොට නරුම ලෙස පාර්ලිමේන්තුව ඉදිරියේ කියා සිටියේ, ආරක්ෂක හමුදාවන් සිදු කලේ දෙමල ජනයා "ස්වේච්ඡාවෙන් පිටවීමට" පහසුකම් සැලසීම පමනක් බව යි.

සිරස රූපවාහිනියට කතා කරමින්, පිටකොටුවේ ලැගුම් හල් හිමියෙක් සිදු වූ දෙය විස්තර කලේ යː "උදේ පාන්දර තුනට විතර පොලීසියයි හමුදාවයි ආවා. මිනිස්සු කාමරවලින් එලියට ගත්තා. අවුරුදු 65ට වැඩි අය හත අටක් විතර හිටියා. අවුරුදු 65ක පමන කාන්තාවක් අඬමින් පොලිස් නිලධාරින් ඉදිරියේ දනින් වැටිලා තමන් ආපසු යවන්න එපා කියලා බැගෑපත් වුනා. ඔවුන් ඒක ගනන් ගත්තෙ නැහැ. තවත් වයසක කාන්තාවන් හතර දෙනෙකුයි වයසක පිරිමි අය හතර දෙනෙකුයි හිටියා."

"කොලඹ ඉස්පිරිතාලෙක දැඩි සත්කාර ඒකකයක දින ගනනාවක් ඉඳලා ආපු කෙනෙක් හිටියා. එයා පොලීසියට එයාගෙ මෙඩිකල් රිපෝට් පෙන්නුවා. ඒ වුනාට ඔවුන් ඒ දිහාවත් නොබලා එයාවත් අරන් ගියා. අපි දන්නෙ නැහැ සැබෑ හේතුව මොකක්ද කියලා. ඒත් පොලීසිය කිව්වා කාටවත් කොලඹ සති දෙකකට වඩා ඉන්න බැහැ කියලා."

බලාත්කාරයෙන් රැගෙන ගිය අය අතර, විවාහ වීමට සූදානම්ව සිය වයස්ගත මව සමග ලැගුම් හලක නතර වී සිටි 23 හැවිරිදි දෙමල තරුනියක් ද සිටි බව ජූනි 8 දා ඩේලි මිරර් පුවත් පත වාර්තා කලේ ය. සතියක් ඇවෑමෙන් පැවැත්වීමට නියමිත විවාහ මංගල උත්සවය වෙනුවෙන් ඔවුන් ශාලාවක් ද වෙන් කරවා ගෙන තිබුනි. ඇය ලන්ඩනයේ සිට පැමිනීමට නියමිත සිය මනාලයා බලාපොරොත්තුවෙන් සිටියා ය. උත්සව ශාලවේ හිමිකරු විසින් නිකුත් කරන ලද රිසිට් පත ඉදිරිපත් කල ද කොලඹ රැඳී සිටීමට ඔවුන්ට "වලංගු හේතුවක් නැති" බව කියා සිටි පොලීසිය යාපනයේ

කරවෙඩ්ඩි බලා ආපසු යන ලෙස ඔවුන්ට අන කලේ ය. විවාහ උත්සවයේ වියදම් පියවා ගැනීමට සිය දේපොල උගස් කර ඇති බැවින් තමන්ට කරවෙඩ්ඩිවල ජීවත් වීමට තැනක් නැති බව ඔවුහු පැමිනිලි කලහ.

මෙලෙස දෙමල ජනයා පලවා හැරීම ශ්‍රී ලංකාව තුල හා ජාත්‍යන්තරව පුලුල් වෛරයක් අවුලුවාලී ය. මානව හිමිකම් හා සංවර්ධන කේන්ද්‍රය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඇතුලු සංවිධාන පහක් ජූනි 7 දා නිවේදනයක් නිකුත් කරමින්, පොලිස් මෙහෙයුම" සිය වාසස්ථානය තෝරා ගැනීමේ අයිතිය හා කැමති තැනක යාමේ නිදහස්" විවෘතව උල්ලංඝනය කිරීමක් බව ප්‍රකාශ කලේ ය.

එල්ටීටීඊ-හිතැති දෙමල ජාතික සන්ධානයට අයත් මන්ත්‍රීවරු මෙහෙයුම සම්බන්ධයෙන් විවාදයක් ඉල්ලා සිටීමෙන් පසුව පාර්ලිමේන්තුව තුල කලබලකාරී තත්වයක් ඇවුලුනි. මෙවන් පලවා හැරීම් නතර නොකල හොත් තමන් පාර්ලිමේන්තුවෙන් ඉවත් වන බව යාපන දිස්ත්‍රික් මන්ත්‍රී සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් තර්ජනය කලේ ය.

ආන්ඩුව දෙමල ජනයාට සලකන ආකාරය නාසි ජර්මනියේ යුදෙව් ජනයා වධ බන්ධනයට ලක් කිරීමට සම කරමින්, විපක්ෂ නායක එක්සත් ජාතික පක්ෂයේ (එජාප) රනිල් වික්‍රමසිංහට ද විරෝධය පල කිරීමට බල කෙරුනි. සිය දෙමල විරෝධී ස්වෝත්තමවාදය සම්බන්ධයෙන් කුප්‍රකට ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) පවා, ආන්ඩුවේ ක්‍රියාවන්" හිතුවක්කාරී, මෝඩ " පිලිවෙත් ලෙස විස්තර කලේ ය. එජාපය 1983 දි රටේ ලේ වැකි සිවිල් යුද්ධය දියත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය. ආන්ඩුව" කොටි ත්‍රස්තවාදීන්ට" විරුද්ධව පූර්න-පරිමාන යුද්ධයක් දියත් කල යුතු යැයි ඉල්ලා සිටීමේ උද්ඝෝෂනයක ජවිපෙ මේ දැන් යෙදී සිටී.

පොලිස් මෙහෙයුමේ වර්ගවාදී ස්වභාවය කෙතරම් නම් විවෘත ද කිය තොත්, එල්ටීටීඊයට එරෙහිව ජනාධිපති මහින්ද රාජපක්ෂ ගෙන යන යුද්ධයට නිහඬ පිටුබලය සපයා ඇති එක්සත් ජනපදය හා ඉන්දියාව කුහක විවේචන සහිත ප්‍රකාශ නිකුත් කලේ ය. තමන් "ත්‍රස්තවාදයට එරෙහිව ස්වකීය ආරක්ෂාව සලසා ගැනීමේ ශ්‍රී ලංකාවේ වගකීම තේරුම් ගන්නා හා එයට සහයෝගය දෙන" බවත් එහෙත් "මෙම ක්‍රියාව ජන වාර්ගික භේදය තව දුරටත් පුලුල් කිරීමට තුඩු දිය හැකි " බවත් එක්සත් ජනපද තානාපති කාර්යාලය ප්‍රකාශ කලේ ය. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ප්‍රකාශිකාවක් දෙමල ජනයා ඉවත් කිරීම පිලිබඳ නව දිල්ලියේ "උත්සුකතා" ප්‍රකාශයට පත් කලා ය.

ජූනි 8 දා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආන්ඩුවේ තීන්දුවට අභියෝග කරමින් රටේ ශ්‍රේෂ්ඨාධිකරනයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කලේ ය. "දෙමල ජනයා කොලඹින් ඉවත් කිරීමට හෝ කොලඹ මොන යම් හෝ කොටසකට ඇතුලු වී එහි රැඳී සිටීමෙන් ඔවුන් වලකාලීමට හෝ කිසිදු පියවරක් නොගන්නා" ලෙස පොලිස්පතිගෙන් ඉල්ලා සිටිමින් අධිකරනය අතුරු නියෝගයක් නිකුත් කලේ ය. කෙසේ වෙතත්. මෙම නියෝගය ඒ වන විටත් පලවා හැරීමට ලක්ව සිටි 376 දෙනා සම්බන්ධයෙන් බල නොපැවැත්වේ.

දේශපාලනික හානිය පාලනය කර ගැනීමේ ප්‍රයත්නයක් ලෙස, ජනාධිපති රාජපක්ෂ රටේ පොලිස් ප්‍රධානියා මෙම තීන්දුව සම්බන්ධයෙන් දඬම්මකු කිරීමට උත්සාහ කලේ ය. ජනාධිපති විසින් ම පත් කරන ලද නිලධාරියකු වන පොලිස්පති පෙරේරාට කතා කල රාජපක්ෂ ඔහුගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් නිදහසට කාරනා ඉදිරිපත් කරන ලෙසත් පලවා හරින ලද සියලු දෙනා යලි කොලඹට ගෙන එන ලෙසත් නියෝග කලේ ය. 186 දෙනෙක් පමනක් ආපසු ගෙන එන ලැබ ඇත. ජූනි 7 දා අත්දැකීම මගින් පැහැදිලිව ම භීතියට පත්ව ඇති සෙසු අය උතුරේ හා නැගෙනහිර සිය ගම් බිම් බලා ආපසු ගියේ ය.

ඉරිදා, අගමැති රත්නසිරි වික්‍රමනායක ජනාධිපති රාජපක්ෂ ගලවා ගැනීමට මැදිහත් විය. "මෙහේ ඉදලා විවිධ ප්‍රදේශවලට මිනිසුන් ගෙන යාම ගැන මම කනගාටුව ප්‍රකාශ කරනවා. එය කොහෙත්ම විය නොයුතුව තිබූ දෙයක්." යැයි ඔහු පැවසී ය. "ආන්ඩුව වගකීම භාර ගන්නවා."

දේශපාලනික හානිය පාලනය කර ගැනීමේ මෙම පාරදෘශ්‍ය ප්‍රයත්නයෙන් කිසිවකු මුලා නොවිය යුතු ය. කොලඹින් අහිංසක දෙමල ජනයා සිය ගනනක් පලවා හැරීම, 2005 නොවැම්බරයේ දී ඔහු ජනාධිපති තනතුර යන්තම් දිනා ගැනීමෙන් පසුව රාජපක්ෂ විසින් ආරම්භ කරනු ලැබ මේ දක්වා ගෙන යනු ලැබ ඇති වර්ගවාදී යුද්ධයේ තාර්කික නිෂ්පාදිතයකි. ආන්ඩුව, දෙමල ජනයා හිරිහැරයට හා වධ බන්ධනයන්ට ලක් කිරීමට ආරක්ෂක හමුදාවන්ට පුලුල් බලතල ලබා දෙමින්. "ත්‍රස්තවාදී සැකකරුවන්" නඩු විභාගවලින් තොරව හිතුවක්කාරී ලෙස රඳවා ගැනීමට ඉඩ දෙන දැඩි ආරක්ෂක නීති යලි පනවා ඇත.

එමෙන් ම, සිය ගනන් ජනයා -- බොහෝ සෙයින් දෙමල ජනයා -- මිලිටරිය සහ ඒ හා සහයෝගී පැරා-මිලිටරි කන්ඩායම්වලට ඒ සම්බන්ධයෙන් පැහැදිලිව ම චෝදනා එල්ල වන කොන්දේසි යටතේ, ඝාතනයට හෝ" අතුරුදහන්" වීමට ලක්ව ඇත. දෙමල මාධ්‍ය හා මාධ්‍යවේදීන් මෙම ආන්ඩු-ගැති ඝාතක කල්ලිවල විශේෂ ඉලක්ක බවට පත්ව ඇත. මෙම සිද්ධීන් එකක් වත් සම්බන්ධයෙන් කිසිවකු අත් අඩංගුවට ගෙන හෝ කිසිවකුට චෝදනා ඉදිරිපත් කර නැති තතු තුල ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන මේ සම්බන්ධයෙන් මුක්ති වාතාවරනයකට අනුමැතිය දී ඇතැයි ආන්ඩුවට චෝදනා කරයි.

එල්ටීටීඊයට එරෙහිව "ත්‍රස්ත විරෝධී යුද්ධයක්" ගෙන යන බවට රාජපක්ෂ කියාපෑවත් සාමාන්‍ය දෙමල ජනයා වධ බන්ධනයට ලක් කිරීම මගින් මෙම දිග්ගැසෙන යුද්ධයේ සැබෑ අරමුන අවධාරනය කෙරෙයි. එනම්, දිවයිනේ සිංහල පාලක ප්‍රභූන්ගේ දේශපාලනික හා ආර්ථික ආධිපත්‍යය පවත්වා ගෙන යාම යි. රාජපක්ෂ හා වික්‍රමනායක සිය මෑතම මර්දන පියවරයන්ගෙන් අඩියක් පස්සට ගෙන ඇත්තේ, එය රට තුල විරෝධතා අවුලුවාලීමේ හා යුද්ධයට පිටුබලය සපයන ජාත්‍යන්තර බලවතුන්ගේ, විශේෂයෙන් ම බුෂ් පාලනාධිකාරයේ, සහයෝගයට වල කැපීමේ තර්ජනය මතු කරන නිසා ම පමනි.

© www.wsws.org